සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – MEDU/AD/11/09/01

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2026/03/09

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
රත්නපුර/ බළන්ගොඩ/ ඇඹිලිපිටිය/ නිවිතිගල/
කෑගල්ල/ දෙහිඕවිට/ මාවනැල්ල,
ස්ථානභාර නිලධාරී,
අධ්‍යාපන පුහුණු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මෙනේරිපිටිය,
අධ්‍යපන සංවර්ධන මධ්‍යස්ථානය- අටුළුගම.

**සබරගමුව පළාත් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය-2023(2026)**

සබරගමුව පළාත් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ හා සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන සියලුම ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ PL-1 කේත අංක යටතේ I, II, III ශ්‍රේණිවලට අයත් සියලුම කණිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයින්ට හා PL-3 කේත අංක යටතේ I, II, III ශ්‍රේණිවලට අයත් මෝටර් රථ රියදුරු සේවයේ සේවකයින්ට හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාගත පත්වීම් සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2023 වර්ෂයට අදාළව පැවැත්වීමට අමාත්‍යාංශය විසින් තීරණය කර ඇති අතර ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති අයගෙන් ඉල්ලුම් පත් කැඳවීම සිදු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ඒ අනුව, ඔබ දෙපාර්තමේන්තුවේ/ කලාප කාර්යාලයේ, පුහුණු මධ්‍යස්ථානයේ සේවය කරනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ වන නිලධාරීන් සම්බන්ධයෙන් මේ සමග එවන ආකෘති පත්‍රය සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියාගේ නිර්දේශයද සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් 2026.03.30 දිනට ප්‍රථම මා වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වන අතර අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසද වැඩි දුරටත් දන්වා සිටිමි.

03. තවද, අයදුම්පත් යොමු කිරීමේදී II, I ශ්‍රේණිවලට අයත් නිලධාරීන්ගේ උසස් කිරීම් ලිපියේ සහතික කළ පිටපතක්ද අදාළ අයදුම්පත සමග එවිය යුතු බවද කාරුණිකව දන්වමි.

එච්.සී. රංගජීව හේමචන්ද්‍ර,
පරිපාලන නිලධාරී.

එච්. සී. රංගජීව හේමචන්ද්‍ර
පරිපාලන නිලධාරී
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

අ/කළේ
බී.ඒ.සී.පී.බමුණුආරච්චි,
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය